# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2302/33 – 2022 ඔක්තෝබර් 21 වැනි සිකුරාදා – 2022.10.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2018 නොවැම්බර් මස 01 වැනි දින අංක 2095/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2018 අංක 289 දරන ආඥාවේ ඇතුළත් ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස් වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජුඩ් හරින් ප්‍රනාන්දු වන මම, එකී ඉඩම් කොටස් අතුරින් පහත 1 උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/7/2017/HA/579.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: DS/GFG/L&L/4/82,
2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මලිගස්පේ (කසි 810019 කලාප 1) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක GA/GFG/2018/512 හා 2018.09.05 දිනැති ප්‍රගමණ අනුරේඛණයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටස් දෙකට මායිම්:

01. **කැබලි ‘B’ – මහගෙදරවත්ත ඕවිට, වරිපනම් අංක 21/36, අනගාරික ධර්මපාල මාවත – ප්‍රමාණය: හෙක්. 1.9920 ක් පමණ**

උතුරට: කඩඉම් සිතියම් අංක 810019 කලාප 1, කැබලි අංක 105, 104, 111, 112, 125, 126 සහ කැබලි A; නැගෙනහිරට: කඩඉම් සිතියම් අංක 810019 කලාප 1, කැබලි අංක 125, 126, කැබලි A සහ කඩඉම් සිතියම් අංක 810019 කලාප 2 කැබලි අංක 83; දකුණට: කඩඉම් සිතියම් අංක 810019 කලාප 1, කැබලි C සහ 137; බටහිරට: කඩඉම් සිතියම් අංක 810019 කලාප 1 කැබලි අංක 137 සහ 176.

02. **කැබලි ‘C’ – මහගෙදරවත්ත අද්දර ඕවිට, වරිපනම් අංක 21/37A අනගාරික ධර්මපාල මාවත – ප්‍රමාණය: හෙක්. 0.6208 ක් පමණ**

උතුරට: කඩඉම් සිතියම් අංක 810019 කලාප 1, කැබලි අංක 137 සහ කැබලි B; නැගෙනහිරට: කඩඉම් සිතියම් අංක 810019 කලාප 2, කැබලි අංක 83; දකුණට: කඩඉම් සිතියම් අංක 810019 කලාප 1, කැබලි අංක 139; බටහිරට: කඩඉම් සිතියම් අංක 810019 කලාප 1, කැබලි අංක 137.

EOG 10 - 0186



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*